ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය : PS/SP/SB/01/චක්‍රලේඛ
චක්‍රලේඛ අංකය : PS/SP/SB/C/14/2019
2019 අප්‍රේල් මස 23 වන දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම දිසාපති/ දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම ආණ්ඩුකාර ලේකම්වරුන්,
පාර්ලිමේන්තු මහලේකම් වෙත

**රාජ්‍ය ආයතන සහ ජාතික වැදගත්කමක් ඇති ස්ථානවල ආරක්ෂාව තහවුරු කිරීම**

2019 අප්‍රේල් මස 21 වැනි දින කොළඹ සහ අනෙකුත් ස්ථානයන් හි සිදු වූ ත්‍රස්ත ප්‍රහාරයන් සහ සිදුවීම් හේතු කොටගෙන විශාල පිරිසකගේ ජීවිත හානිවී, තවත් පිරිසක් තුවාල ලබා ප්‍රතිකාර ලබමින් සිටී. එසේම, ආගමික ස්ථාන ඇතුළු වටිනා දේපළ විනාශ වී ඇති අතර, රටෙහි ආර්ථික ක්‍රියාවලියට සහ මහජන ආරක්ෂාවට ද තර්ජනයක් එල්ල වී ඇත.

මෙම පසුබිම තුළ සියලුම රාජ්‍ය ආයතන වෙත සිය කාර්ය මණ්ඩලයේ සහ පොදු ජනතාවගේ ආරක්ෂාව මෙන්ම ජාතික ආර්ථිකයේ වැදගත් ස්ථාන සහ ක්‍රියාවලීන් ද ආරක්ෂා කිරීමේ ජාතික වගකීමක් පැවරී ඇත. එබැවින් ඔබ අමාත්‍යාංශය / ආයතනය යටතේ ඇති සියලුම ස්ථානයන්හි පැය 24 පුරාම ක්‍රියාත්මක වන පුළුල් ආරක්ෂක වැඩපිළිවෙලක් කඩිනමින් ආරම්භ කළ යුතුය.

ඒ අනුව, ඔබගේ ආයතනය සහ ඔබ යටතේ පවතින සියලුම ආයතන, ඒවායේ කාර්ය මණ්ඩල, සේවාදායකයින් සහ සෙසු මහජනතාවගේ ආරක්ෂාව සහ සුහසිද්ධිය තහවුරු කිරීම සඳහා වහාම ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ක්‍රියාමාර්ග ගන්නා ලෙස අතිගරු ජනාධිපතිතුමාගේ නියෝගය පරිදි දන්වමි.

1. දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතින ආරක්ෂක විධිවිධාන යළි සමාලෝචනය කොට, පවතින තත්ත්වයට මුහුණදීමට හැකිවන පරිදි යාවත්කාලීන කිරීම.
2. ඔබ යටතේ පාලනය වන අත්‍යාවශ්‍ය සේවා සපයනු ලබන ආයතන හදිසි අවස්ථාවකදී ක්ෂණිකව සහ අඛණ්ඩව සේවා සැපයීමට හැකිවන පරිදි සූදානම් කර තැබීම.
3. ඔබ යටතේ පාලනය වන විශේෂ ආරක්ෂාව අවශ්‍ය ස්ථාන සඳහා ආරක්ෂක අංශ සමඟ සම්බන්ධීකරණයෙන් පූර්ණ ආරක්ෂක වැඩපිළිවෙලක් සකස් කර ගැනීම.
4. හදිසි ආපදා අවස්ථාවකදී ක්‍රියා කළයුතු ආකාරය සහ ආපදා අවස්ථා සිදුවුවහොත් ඒ සඳහා වන පෙර සූදානම පිළිබඳ ආයතනයේ සෑම කාර්ය මණ්ඩල සාමාජිකයෙකුම දැනුවත් කිරීම සහ අවශ්‍ය පුහුණුව ලබාදීම.
5. හදිසි අවස්ථාවකදී ආයතනවල කාර්ය මණ්ඩල සාමාජිකයින් සම්බන්ධ කර ගැනීම සඳහා ඔවුන් පිළිබඳ සන්නිවේදන තොරතුරු පවත්වා ගෙන යාම.
6. සැක කටයුතු පුද්ගලයින්, භාණ්ඩ සහ වාහන නිරීක්ෂණය කරන්නේ නම්, එවැනි අවස්ථාවකදී අදාළ ආරක්ෂක අංශ වෙත දැනුම් දීම සඳහා කාර්ය මණ්ඩල, සේවාදායකයින් සහ සෙසු මහජනතාව දැනුවත් කිරීම.



ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax ++ 94 11 2446657
ඉ-තැපැල / மின்-அஞ்சல் / e-mail prsec@presidentsoffice.lk

7. ආරක්ෂක විධිවිධාන ශක්තිමත් කිරීම සඳහා හැකිතාක් නවීන තාක්ෂණික ක්‍රම සහ ක්‍රමෝපායන් උපයෝගී කර ගැනීම.

8. ආරක්ෂාවට තර්ජනයක් වන ආකාරයේ කටකථා පැතිර යාම වළක්වා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

9. ඔබ යටතේ පවතින සියලුම ආයතන, ඒවායේ කාර්ය මණ්ඩල, සේවාදායකයින් සහ සෙසු මහජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නිරන්තරයෙන් ආරක්ෂක අංශ සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම හා අවශ්‍ය සෑම අවස්ථාවකදීම ආරක්ෂක අංශ වෙත පූර්ණ සහයෝගය ලබා දීම.

10. විශේෂයෙන් රටේ වැදගත් ආර්ථික මධ්‍යස්ථාන සහ ආර්ථික ක්‍රියාවලීන්ගේ ආරක්ෂාව සහ අඛණ්ඩ පැවැත්ම තහවුරු කරනු වස් අනුගමනය කළයුතු සියලු විධිවිධාන සහ ක්‍රමෝපායන් අනුගමනය කිරීම සහ ඒ පිළිබඳව නිරන්තර පසුවිපරමින් යුතුව අධීක්ෂණය කිරීම.

11. සෑම ආයතනයක් තුළම ආරක්ෂාව පිළිබඳව නිරන්තර පසුවිපරම් කරනු ලබන, කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් යුතු **"ආරක්ෂක කමිටු"** සුදුසු පරිදි ස්ථාපිත කොට සක්‍රිය ලෙස ක්‍රියාකාරී වැඩපිළිවෙලක් දියත් කිරීම සහ හදිසි අවස්ථාවන්හිදී මුහුණදීමට හැකිවන පරිදි ආරක්ෂක පෙරහුරු පැවැත්වීමට කටයුතු කර, ඒ පිළිබඳව ප්‍රධානීන් විසින් අධීක්ෂණය කිරීම.

12. තම ආයතනවල ආරක්ෂක විධිවිධාන හා ක්‍රියා පරිපාටීන් පිළිබඳව සෑම සතියකම ආයතන ප්‍රධානීන් විසින් සමාලෝචනය කොට මනා අධීක්ෂණ ක්‍රියාවලියක් පවත්වාගෙන යෑම සහ ඒ පිළිබඳ ප්‍රගති වාර්තාවක් අදාළ ආරක්ෂක ප්‍රධානීන් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

13. ජාතීන් සහ ආගම් අතර සහජීවනය හා සහයෝගීතාවය අඛණ්ඩව ආරක්ෂා කර ගැනීම සඳහා ඒ ඒ ජන කොටස්වල ප්‍රධානීන් සහ ආගමික නායකයින් සමඟ නිරතුරුව අන්‍යෝන්‍ය සහයෝගයෙන් ක්‍රියා කිරීම.

ඉහත ක්‍රියාමාර්ග කඩිනමින් හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඔබගේ පූර්ණ සහයෝගය අපේක්ෂා කරමි.

**උදය ආර්. සෙනෙවිරත්න**
**ජනාධිපති ලේකම්**

පිටපත් :

1. අග්‍රාමාත්‍ය ලේකම්
2. අමාත්‍ය මණ්ඩල ලේකම්
3. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
4. ත්‍රිවිධ හමුදා ප්‍රධානීන්
5. පොලිස්පති